# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது<br>My No | DSD/HO6/EP/2/9/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................... | දිනය<br>திகதி<br>Date | 2022.03.04 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික්ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම් වරුන්,
සියළුම මූලස්ථාන, බැංකු සමිති, ප්‍රජාමුල බැංකු කළමනාකරුවන්,
සියළුම සංවර්ධන නිලධාරීන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

## "සමෘද්ධි අභිමානී" වෙළඳ ප්‍රදර්ශනය හා අලෙවි පොල - 2022

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අලෙවි අංශය මගින් "සමෘද්ධි අභිමානී" වෙළඳ ප්‍රදර්ශනය හා අලෙවි පොල මෙම වසරේ සිංහල හා හින්දු අළුත් අවුරුද්ද මුල් කරගෙන පැවැත්වීමට අදහස් කර ඇත. එහිදී ඔබ දිස්ත්‍රික්කයේ සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදනවලට ඇති ඉල්ලුම හා අලෙවි අවස්ථා පුළුල් කරලීමත් එම නිෂ්පාදන දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රචලිත කිරීමත් විශේෂයෙන්ම උත්සව සමයේදී අත්‍යාවශ්‍ය භාණ්ඩ සහන මිලට ජනතාව වෙත මිලදී ගැනීමට අවස්ථාව සලසා දීමත් අරමුණු කොට පැවැත්වීමට අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

දිස්ත්‍රික්කයේ <u>සෑම සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිති බල ප්‍රදේශයක් තුලම</u> අලෙවි පොලක් සංවිධානය කළ යුතු අතර අප්‍රේල් මස 7 – 10 කාලය තුලදී අවම දින දෙකක් වත් පැවැත්විය යුතුය. සමෘද්ධි ව්‍යාපාරික සංගම්, ප්‍රදේශිය සංවිධාන හා ප්‍රජාමූල සංවිධානවල යෝජනා ද ලබාගැනිමට හැකිවන පරිදි මෙහෙයුම් කමිටුවක් පිහිටුවා එමගින් පොල කටයුතු සංවිධානය කිරීම පිළිබඳව තීරණය කිරීම යෝග්‍ය වන අතර පහත කරුණු කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

i. වෙළඳ කුටි, විදුලිය, ප්‍රචාරණය ආදි අත්‍යාවශ්‍යය වියදම් සඳහා වැය කළ හැකි උපරිම ප්‍රමාණය රු. 100,000.00 ක් වන අතර එම වියදම් දැරීම සඳහා "අලෙවි පොල චක්‍රීය අරමුදල" භාවිතා කළ හැකිය. යම් හෙයකින් එය ප්‍රමාණවත් නොවන අවස්ථාවක ඉහත සීමාවට යටත්ව සමෘද්ධි බැංකු සමිති අරමුදල් භාවිතා කළ හැකි අතර මේ පිළිබඳව වැඩිදුර උපදෙස් ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ඔබ වෙත ලබා දෙනු ඇත.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887 |

ii. ආදායමක් ඉපයීමට හැකි වන ලෙස වාණිජමය ආකාරයෙන් සංවිධානය කිරීම වඩාත් යෝග්‍ය වන අතර අනෙකුත් වාණිජ හා වාණිජ නොවන බැංකු හා මූල්‍ය ආයතන මෙන්ම, ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික ආයතනවල අනුග්‍රහය ලබාගැනීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය

iii. මෙම අලෙවි පොලෙන් ලැබෙන සියළු ආදායම් "අලෙවි පොල චක්‍රීය අරමුදල"ට බැර කිරීමට කළ යුතුය.

iv. සහල්, පොල් වැනි අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ***සහන මිලට*** ප්‍රජාව වෙත සපයන වෙළඳුන්ට ප්‍රමුඛත්වය හා අවස්ථාව සැලසිය යුතු අතර වැඩි ව්‍යාපාරිකයින් පිරිසකට සහභාගී වීමට හැකිවන ලෙස වැඩසටහන සංවිධානය කළ යුතුය. එසේම දිස්ත්‍රික්කය තුල මේ වන විටත් ආරම්භ කර ඇති ආදර්ශ ගම්මානයේ/ගම්මානවල නිෂ්පාදන සඳහා ද ඉඩප්‍රස්ථා ලබාදීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

v. මෙම පොල සංවිධාන කටයුතු කිරීමේදී සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහාය ලබා දිය යුතුය.

vi. සිංහල හා හින්දු ප්‍රජාව ජීවත් නොවන ප්‍රදේශවල අලෙවි පොල සාර්ථක ලෙස පැවැත්වීම පිළිබඳව ගැටළු කාරී තත්ත්වයක් වේ නම් දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන් මූලිකත්වයෙන් ඒ පිළිබඳව තීරණය කර අලෙවි අංශය දැනුවත් කළ යුතුය.

vii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහභාගිත්වය හා සහාය හැකි සෑම අවස්ථාවකම ලබාදීමට අදහස් කරන බැවින් අලෙවි පොල පැවැත්වෙන දින හා අවශ්‍ය සහාය පිළිබඳව ව්‍යවසාය සංවර්ධන අංශය දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

viii. ප්‍රදර්ශනය හා අලෙවි පොල අවසානයේ මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර කඩිනමින් අලෙවි සංවර්ධන අංශය වෙත යොමු කල යුතුය.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :

| | | | |
|---|---|---|---|
| 1. | ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - කා.දැ.ගැ.පි |
| 2. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සවිබලගැන්වීම්) | - කා.දැ.ගැ.පි |
| 3. | අධ්‍යක්ෂ(ක්ෂුද්‍ර මූල්‍ය) | - කා.දැ.ගැ.පි හා අ.ක.ස |
| 4. | අධ්‍යක්ෂ (ජීවනෝපාය) | - කා.දැ.ගැ.පි හා අ.ක.ස |
| 5. | ස. අධ්‍යක්ෂ (ප්‍රජාමූල) | - කා.දැ.ගැ.පි හා අ.ක.ස |